කාන්තාවක් ලිංගික අපයෝජනයට ලක් කිරීමට වරදකරු වූ කඳපොල හයිෆොරස්ට් පොලිස් ස්ථානයේ නිලධාරියෙකු හට නුවරඑළිය මහාධිකරණයෙන් ලබා දුන් නඩු තීන්දුව, අරුණ පුවත් වාර්තාවක් (පෙබරවාරි 15, 2024) ඔස්සේ මෙසේ ඉදිරිපත් වී තිබිණි.

සිරස්තලය - "අවිවාහක කතක කෙලෙසූ පී.සී. වසර හතක් හිරේට" (මෙය ලිංගික අපයෝජනයක් බව පුවත් අන්තර්ගතයේ දැක්වේ.)

යම් පුවතකට අදාළ නොවන අවස්ථාවලදී පුද්ගලයින්ගේ විවාහක අවිවාහක බව වැනි කරුණු ඉස්මතු කර දැක්වීම සැබවින්ම අවශ්‍ය වන්නේද යන පැනය, පාඨක අප ඇසිය යුත්තකි.

ඒ අනුව,

1) මෙම කාන්තාවගේ විවාහක අවිවාහක භාවය මෙම පුවත් වාර්තාවට අදාළ ද? එසේනම්, ඒ කුමන පදනමක් මතද?

2) "කෙලෙසීම" වැනි යෙදුමක් ඔස්සේ ලිංගික අපයෝජනයක් හෝ ලිංගික අපරාධයක් හැඳින්වීමේදී, ඊට මුහුණ දුන් අය අපවිත්‍ර වී ඇති බවට හැඟීමක් ගම්‍ය නොවන්නේ ද? මෙවැනි යෙදුම් බහුලව භාවිතා වුවත්, එම යෙදුම් වලට කළ හැකි සමාජ බලපෑම සම්බන්ධයෙන් මාධ්‍ය වඩාත් සවිඥාණික විය යුතු නොවන්නේ ද?

ලිංගික අපරාධ සම්බන්ධයෙන් වගකීම් සහගතව වාර්තා කරමු!

